පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව

ශ්‍රේණිය - 13

සතිය- 41

විෂය - නාට්‍ය හා රංග කලාව

සැකසුම - සරසි පිරිස්

**නිපුණතාව 5 - නාට්‍ය හා රංග කලාව සම්බන්ධ විෂය නිර්මාණ රසාස්වාදය හා විචාරයට ලක් කරමින් ජීවන අත්දැකීම් පෝෂණය කරයි**

**නිපුණතා මට්ටම 5.6- වේදිකා නාට්‍ය කලාවේ පැවැත්ම හා වර්ධනය සඳහා ප්‍රේක්ෂක ප්‍රතිචාර වල වැදගත්කම වටහා ගනියි**

**පාඩම - ප්‍රේක්ෂක ප්‍රතිචාර පිළිබඳ අධ්‍යයනය**

**<u>ඉගෙනුම් ඵල</u>**

1. නිර්දිෂ්ට නාට්‍ය පෙළ මැනවින් රසවිඳීමට ප්‍රේක්ෂක ප්‍රතිචාර බෙහෙවින් ඉවහල් වන බව පෙන්වා දේ
2. කාලීන සමාජ අවශ්‍යතාවලට සරිලන පරිදි අදාළ නිර්දිෂ්ට නාට්‍යයන්හි නාට්‍යයන්හි වෙනස්කම් ඇති කිරීම සඳහා ප්‍රේක්ෂක ප්‍රතිචාර වැදගත් බව පිළිගනී
3. විවිධ මතිමතාන්තර හා ආකල්ප සහිත පුද්ගලයන් සමාජයේ සිටින බැවින් ඔවුන්ගේ මතිමතාන්තර විඳදරා ගැනීමට අවශ්‍ය ශක්තිය ගොඩනගා ගැනීම
4. ප්‍රේක්ෂක ප්‍රතිචාර මගින් නිර්දිෂ්ට නාට්‍යයන්හි ගුණාත්මක බව හඳුනාගැනීම

**<u>ශිෂ්‍යයා කලයුතු කාර්යයන්</u>**

1. නිර්දිෂ්ට නාට්‍ය පෙළ හොඳින් කියවන්න .හැකිනම් youtube නාලිකාව ඔස්සේ නාට්‍ය පෙළ හෝ කොටස් නරඹන්න
2. නාට්‍ය හා ප්‍රේක්ෂකයා පිළිබඳ 12 ශ්‍රේණියේ දී ඔබ උගත් කරුණු සිහියට ගන්න
3. නිර්දිෂ්ට නාට්‍ය පෙළ අයත් යුගයන්හි දක්නට ලැබෙන සුවිශේෂිත ඇසුරින් ප්‍රේක්ෂක ප්‍රතිචාර ගොඩනැගෙන බව සොයන්න
4. නිර්දිෂ්ට නාට්‍ය පෙළයන්හි අනුශාංගික අංග ,රංග ශෛලිය ,රූපණ කුසලතා පිළිබඳ දක්වන ප්‍රේක්ෂක ප්‍රතිචාර සම්බන්ධ විස්තර සොයන්න
5. නිර්දිෂ්ට නාට්‍ය පෙළයන් බිහිවූ යුගයන්හිදී බිහිවූ වෙනත් නාට්‍ය පිළිබඳ කරුණු සොයන්න

**<u>මෙම ක්‍රියාකාරකම සඳහා යොදා ගත හැකි ඉගෙනුම් ආධාරක</u>**

1. https://youtu.be/Kqw_ELD83Rk

**<u>පොත් පත්</u>**

1. නිර්දිෂ්ට නාට්‍ය ග්‍රන්ථයන්

**ඇගයීම**

1. ප්‍රේක්ෂකයා යනු , රසිකයෙකු විචාරකයෙකු මෙන්ම විනිශ්චයකරුවෙකුද වේ...නිර්දිෂ්ට නාට්‍යයක් ඇසුරෙන් මෙම කියමන උදාහරණ සහිතව පහදන්න...

**පසුවැඩ**

1. ඔබ ප්‍රේක්ෂකයෙකු ලෙස නරඹන ලද එක් වේදිකා නාට්‍යයක් සිහියට ගනිමින් අපේක්ෂකයා ලෙස ඔබ ලද අත්දැකීම පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.